දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපෑල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

සෞඛ්‍ය අමාත්‍යාංශය
சுகாதார அமைச்சு
**Ministry of Health**

මගේ අංකය )
எனது இல ) **CF/EXG/14/2024**
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி ) **2024/08/..29**
Date )

පොදු චක්‍රලේඛ ලිපි අංක : 02 - 126 /2024

පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්,

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා ජාතික රෝහල - කොළඹ

අධ්‍යක්ෂ - ජාතික රෝහල, මහනුවර

රේඛීය අමාත්‍යාංශ යටතට ගැනෙන සියළුම රෝහල් අධ්‍යක්ෂවරුන්,

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,

ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,

අදාල අයතන ප්‍රධානින්,

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය PL – 01 – 2006(ඒ) තනතුරුවල I ශ්‍රේණිය සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2024 (දෙවන වාරය)**

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයට PL – 01 – 2006 (ඒ) අයත් තනතුරු සඳහා වන I ශ්‍රේණියට උසස් වී වසර 05 ක් ගතවීමට පෙර සමත් විය යුතු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සිංහල, ඉංග්‍රීසි හා දෙමළ මාධ්‍යවලින් 2024/10/20 දින පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය පවත්වනු ලබන ස්ථානය හා වේලාව ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත.

02 **සුදුසුකම්**

මෙම වාචික පරීක්ෂණයට අයදුම්කල හැක්කේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය PL – 01 – 2006 (ඒ) සඳහා වන තනතුරක (කාර්යාල කාර්ය සහයක, ඇසුරුම්කරු, පොත් බැඳුම්කරු, පාපැදි පණිවිඩකරු, මුරකරු, ගබඩාකරු, විදුලි සෝපාන ක්‍රියාකරු, අනු පිටපත් රෝනියෝ යන්ත්‍ර ක්‍රියාකරු, ඉසින යන්ත්‍ර ක්‍රියාකරු, සහයක - මාධ්‍ය අංශය, ඡායාරූප ශිල්පී - මාධ්‍ය, ඡායාරූප සහකාර, වීඩියෝ සංස්කරණ ශිල්පී, වීඩියෝ කැමරාකරණ ශිල්පී, සෞඛ්‍ය කාර්ය සහයක (සාමාන්‍ය), සෞඛ්‍ය කාර්ය සහයක (කනිෂ්ඨ)) I ශ්‍රේණියේ පත්වීමක් ලබා සිටින හා මේ වන විට විභාගය සම්පූර්ණ නොකළ නිලධාරීන්ට පමණි.

**(සැ:යු): - අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන 2024/09/18 දින වන විට I ශ්‍රේණියට පත්කර, අදාළ පත්වීම් ලිපිය ලබා ඇති නිලධාරීන්ගේ අයදුම්පත් පමණක් මා වෙත එවීමට කටයුතු කරන්න. ( I ශ්‍රේණියට පත් කරන ලද ලිපියේ සහතික කරන ලද පිටපතක් අයදුම්පත්‍රය සමඟ අමුණා එවීම අනිවාර්ය වේ.)**

(සැලකිය යුතුයි : - සෞඛ්‍ය ලේකම්ගේ පොදු චක්‍රලේඛ ලිපි අංක 02- 90/2015 හා 2015.08.12 දිනැති ලිපියේ සඳහන් 2012.07.20 දිනට කාර්යාල කාර්ය සහයක, පොත් බැදුම්කරු, මුරකරු, ඉසින යන්ත්‍ර ක්‍රියාකරු, සෞඛ්‍ය කාර්ය සහයක (සාමාන්‍ය), සෞඛ්‍ය කාර්ය සහයක (කනිෂ්ඨ) I ශ්‍රේණියේ වසර 05 ක් ඉක්මවා ඇති නිලධාරීන් මෙම විභාගයෙන් නිදහස් කර ඇති බැවින් මේ සඳහා පෙනී සිටිය යුතු නොවේ. තවද සෞඛ්‍ය ලේකම්ගේ පොදු චක්‍රලේඛ ලිපි අංක 02- 90/2015 (P) හා 2016.02.25 දිනැති ලිපියේ සඳහන් පරිදි ඇසුරුම්කරු, පාපැදි පණිවිඩකරු,

ගබඩාකරු, විදුලි සෝපාන ක්‍රියාකරු, අනු පිටපත් රෝනියෝ යන්ත්‍ර ක්‍රියාකරු, යන තනතුරු සඳහා පැරණි බඳවා ගැනීමේ පටිපාටිය අනුව " විෂය දැනුම " හෝ " ආයතන සංග්‍රහය " හා "මුදල් රෙගුලාසි " යන එක් විෂයයක් හෝ සමත් නම්, නව බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දින සිට කාර්යක්ෂමතා කඩඉම් සමත් වීම අවශ්‍ය නැත.)

## 03 අයදුම්පත්

මෙම චක්‍රලේඛ ලිපිය අවසානයේ දක්වා ඇති ආකෘතිය අනුව අයදුම්කරුවන් විසින් සකස් කරගත යුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින්, කොළඹ 10, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, අංක 385, "සුවසිරිපාය" සෞඛ්‍ය අමාත්‍යාංශය, අධ්‍යක්ෂ (විභාග) වෙත **2024/09/18** දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි **"PL – 01- 2006 (ඒ) I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2024 (දෙවන වාරය)"** ලෙස අයදුම් කරන විභාගයෙහි නම සඳහන් කළ යුතුය. **මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටීමට අයදුම්කරු විසින් අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවට පෞද්ගලික ලිපිගොනු භාර විෂය නිලධාරියා විසින් ද, සෑම අයදුම්පතකම දක්වා ඇති තොරතුරු සියල්ල නිවැරදි බව ආයතන ප්‍රධානියා විසින් ද සහතික කර තිබීම අනිවාර්යය වේ.** තම අයදුම්පත සමග රාජකාරී ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලියන ලද රු.110.00 ක් වටිනා මුද්දර ඇලවූ 9×4 ප්‍රමාණයේ ලියුම් කවරයක් එවිය යුතුය. **ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ද, අසම්පූර්ණ හෝ වැරදි සහිත වන අයදුම්පත් ද නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**සැ.යු.:- ආදර්ශ අයදුම්පතෙහි ආකෘතියට අනුව, අයදුම්පත්‍රය $A_4$ කඩදාසියක පළමු පිටුවේ අංක 01 සිට 04 දක්වාත් දෙවන පිටුවේ අංක 05 සිට 08 දක්වාත් සකස් කළ යුතුය. ඉහත ආකෘතියට අනුකූල නොවන සියළුම අයදුම්පත්‍ර නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

## 04 විභාග ගාස්තු

I විභාගයට පළමු වරට ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාග ගාස්තුවලින් නිදහස් කරනු ලැබේ. අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයකට රු. 25/- බැගින් අවලංගු නොකළ මුද්දර ඉල්ලුම් පත්‍රයේ අලවා තමන්ගේ අත්සන හා දිනය යොදා අවලංගු කළ යුතුය.

II කිසිදු කරුණක් මත මෙසේ ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදුකරනු නොලැබේ.

## 05 විභාගයට ඇතුලත්කර ගැනීම.

I පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයන්ට ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත් නියමිත පරිදි සම්පූර්ණ කර පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ නොමැතිව වාචික පරීක්ෂණයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

II විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුලදී පරීක්ෂණ මණ්ඩලයට ස්වකීය අනන්‍යතාවය තහවුරු කල යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියකියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළ යුතුය.

(අ) ජාතික හැඳුනුම්පත

(ආ) සෞඛ්‍ය අමාත්‍යාංශය හෝ ඊට අදාල ආයතනයක් මගින් විධිමත් ලෙස නිකුත් කරන ලද හැඳුනුම්පත

(ඇ) වලංගු රියදුරු බලපත්‍රය

(ඈ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

06 විභාග පරිපාටිය

- වාචික පරීක්ෂණයකි. ( පරීක්ෂණ මණ්ඩලයක් මගින් අසනු ලබන ප්‍රශ්න සඳහා වාචිකව පිළිතුරු සැපයිම් කල යුතුය)
- කාලය මිනිත්තු 15 යි.
- මුළු ලකුණු 100 කි. සමත් වීම සඳහා අවම වශයෙන් ලකුණු 40 ක් ලබාගත යුතුය.

07 **විෂය නිර්දේශ මාලාව**

**සාමාන්‍ය පරිපාලනය :-**

පළමුවැනි හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේදී ආවරණය වූ විෂයයන්ට අදාළව ගත වූ සේවා කාලය තුළ අදාල ක්ෂේත්‍රය තුල සිදු වී ඇති පටිපාටිමය, නිතිමය සංශෝධනයන් වැනි වෙනස්විම් පිළිබඳ සේවකයාගේ දැනුම සහ ඔහුගේ කාර්යයට අදාල නව්‍යකරණයන් පිළිබඳ සේවකයාගේ කුසලතා පිළිබඳ මැන බැලිම.

08 **විභාග සම්බන්ධ රෙගුලාසි අනුගමනය කිරීම**

වාචික පරීක්ෂණයට අදාලව පනවනු ලබන සෑම රෙගුලාසියකට ද, විභාග කටයුතු සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන අනෙකුත් නිති හා රෙගුලාසින්ට ද විභාග අපේක්ෂකයන් අවනත විය යුතුය. එසේම වෙනත් අයදුම්කරුවෙකුට උදව් කිරීමෙන් හෝ වෙනත් අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් උදව් ලබාගැනිමෙන් ද වැළකි සිටිය යුතුය. තවද ජංගම දුරකථන හා ඒ හා සමාන සන්නිවේදන හා විද්‍යුත් උපකරණ ද භාවිතා කිරීමෙන් වැළකි සිටිය යුතුය. මෙම නිති කඩ කරනු ලබන ඕනෑම අපේක්ෂකයෙකු දඩුවම් ලැබීමට යටත් වනු ඇත.

09 කරුණාකර මෙම චක්‍රලේඛ ලිපියේ අඩංගු දෑ ඔබ ආයතනයේ නියුතු සියළුම සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයට අයත් PL – 01 – 2006 (ඒ) වැටුප් පරිමාණය නියමකර ඇති I ශ්‍රේණියේ නිලධාරින්ගේ දැනගැනිමට සලස්වන්න. ( මෙම තොරතුරු www.health.gov.lk වෙබ් අඩවියෙන් ද ලබාගත හැකිය.)

**සැ.යු මෙම චක්‍රලේඛ ලිපියේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි නිවේදනයන්හි පාඨ අතර යම් අනනුකූලතාවක් මතුවුවහොත් සිංහල මාධ්‍ය විභාග නිවේදනය බලපැවැත්වේ.**

චාමික එච්. ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.

Gamage

චාමික එච් ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
ලේකම් වෙනුවට

EXG

ආදර්ශ අයදුම්පත

කාර්යාලිය ප්‍රායෝජනය සඳහා

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රාථමික ශිල්පිය නොවන සේවා ගණය PL – 01 – 2006(ඒ) තනතුරුවල I ශ්‍රේණිය සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2024 (දෙවන වාරය)**

01 (අ) (i) අයදුම්කරුගේ සම්පූර්ණ නම (සිංහලෙන්) ..........................................

..........................................................................................

(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම (ඉංගිසි කැපිටල් අකුරින් ):

(iii) මුලකුරු සමඟ නම (සිංහලෙන් ) : ..........................................

..........................................................................................

(iv) මුලකුරු සමඟ නම ( ඉංග්‍රිසි කැපිටල් අකුරින් )

(ආ)

i. තනතුර ..........................................

ii. I ශ්‍රේණියට උසස් කල/ අන්තර්ග්‍රහණය කළ දිනය ............ ලිපි අංකය ............

**( I ශ්‍රේණියට උසස් කරන ලද ලිපියේ සහතික කරන ලද පිටපතක් අයදුම්පත සමඟ අමුණන්න)**

iii. 2012.07.20 වන දිනට I ශ්‍රේණියේ සේවා කාලය..........................................

iv. දැනට ලබන වාර්ෂික වැටුප ..........................................

v. ජංගම දුරකථන අංකය

vi. ජාතික හැඳුනුම්පත් අංකය

vii. විද්‍යුත් ලිපිනය ..........................................

02 (අ) දැන් සේවය කරන ආයතනය

(සිංහලෙන්)..........................................

(ඉංග්‍රිසියෙන්) ..........................................

(ආ) එය අයත් දිස්ත්‍රික්කය ..........................................

(ඇ) මෙම ආයතනය අයත් වන්නේ - රේඛීය අමාත්‍යාංශයට -

- පළාත් සභාවට -

(ඈ) පළාත් සභාව යටතේනම් එය අයත් පළාත ..........................................

(ඉ) විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා පැහැදිලිව ලිපිනය ලියන ලද 9" X 4" ප්‍රමාණයේ රු 110.00 ක මුද්දර ඇලවූ ලියුම් කවරයක් අයදුම්පත්‍රයට අමුණන ලද්දේද? ..........................

(ඊ) (i) තැපැල් ලිපිනය ( සිංහලෙන් ) ..........................................

..........................................................................................

(ii) තැපැල් ලිපිනය ( ඉංග්‍රිසි කැපිටල් අකුරින් ) ..........................................

..........................................................................................

03 විභාගයට පෙනී සිටින මාධ්‍යය ( සිංහල / දෙමළ / ඉංග්‍රිසි )..........................................

04 (i) මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේද?..........................

(11) අයදුම්පත් ඉදිරිපත් කරන්නේ ප්‍රථම වරට නොවේ නම් මුද්දර අලවා තිබේද?..............

මුද්දර කොටුව

05 අයදුම්කරුගේ සහතිකය

මගේ දැනුම හා විශ්වාසය පරිදි,

(i) මෙම අයදුම් පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත්, මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත්/ ප්‍රථම වතාවට නොවන බැවින් රු.25.00ක් වටිනා මුද්දර අලවා ඇති බවත් * මෙම අයදුම් පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත් ප්‍රකාශ කරමි.

(ii) සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීති වලට එකඟව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකඟ වන බවත් මෙයින් සහතික කරමි.

..................................

දිනය .................................. අයදුම්කරුගේ අත්සන

06 පෞද්ගලික ලිපිගොනු භාර විෂය නිලධාරී/ නිලධාරිනියගේ සහතිකය

මෙම අයදුම්පත් බාර ගන්න අවසාන දිනයට පෙර/ පසු මා වෙත බාරදුන් බවත්, පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරුවලට අනුව අයදුම්කරු විසින් නිවැරදිව මෙම අයදුම්පත සම්පූර්ණ කර ඇති බවත්, I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටීමට අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවත් මෙම අයදුම්පතේ පිටපතක් පෞද්ගලික ලිපි ගොනුවට ගොනුකළ බවත් සහතික කරමි.

දිනය ..................................

..................................

නම සහ අත්සන

07 ආයතන ප්‍රධානියාගේ සහතිකය

....................................................................................................මහතා/මිය/මෙනවිය*..............................................

නිලධාරියකු වශයෙන් මෙම ආයතනයේ සේවය කරන බවටත් මෙම විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට/ප්‍රථම වතාවට නොවන* බවද, රු .............. / ක් වටිනා මුද්දර මෙම අයදුම්පත්‍රයට අලවා ඇති බව ද / මුද්දර ඇලවීම අනවශ්‍ය බවට ද* අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පුද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි. මා ඉදිරිපිටදී අත්සන් කල බව ද සහතික කරමි.

දිනය ......................................

..........................................

ආයතන ප්‍රධානියාගේ අත්සන
(මුද්‍රාව තැබිය යුතුය)

08 විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ සහතිකය

...............................................මහතා / මහත්මිය / මෙනවිය, ........................................

නිලධාරියෙකු වශයෙන් මගේ ආයතනයේ සේවය කරන බවත්, අයදුම්පතේ දි තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට / ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

දිනය .........................

..........................................

විමධ්‍යගත කොට්ඨාශ
විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ
අත්සන [රබර් මුද්‍රාව තැබිය යුතුය]

(*අනවශ්‍ය කොටස් කපා හරින්න )